# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 නොවැම්බර්


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 65.0%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 70.6%ක් ලෙස වාර්තා විය. 2022 නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 33.9%ක හා ආහාර නොවන කාණ්ඩයේ 31.0%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 නොවැම්බර් මාසයේ 11.1%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 7.8%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.3%ක් විය. 2021 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2022 නොවැම්බර් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. කෙසේ වෙතත්, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය (ලක්ෂ්‍යමය) 2022 ඔක්තෝම්බර් මාසයේදී 80.9% සිට 2022 නොවැම්බර් මාසයේදී 69.8% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) ද 2022 ඔක්තෝම්බර් මාසයේදී 61.3% සිට 2022 නොවැම්බර් මාසයේදී 60.4% දක්වා අඩු විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 ඔක්තෝම්බර් මාසයේ 256.9ක් වූ දර්ශකාංකය 2022 නොවැම්බර් මාසයේ 256.3ක් දක්වා අඩුවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 නොවැම්බර් මාසයේ දර්ශකාංකය 0.6ක අඩුවීමක් එනම් 0.2%ක ප්‍රතිශතාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.49%කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.23%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට අළුත් මාළු, සීනි, හාල්, කරවල, කුකුල්මස්, කිරිපිටි, මයිසූර් පරිප්පු, පාන්, අමුමිරිස්, අළුත් පළතුරු, මිරිස්කුඩු, පොල්තෙල් සහ බිස්කට් වර්ග යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් ලොකුළූණු, එළවළු, කිරිපිටි, පොල්, රතුළූණු, තේ කොළ/කුඩු, බිත්තර හා අර්තාපල් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*බලශක්ති පිරිමැසුම් බල්බ, සබන් වර්ග, සේදුම් කුඩු*), 'සෞඛ්‍ය' (*ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම හා පෞද්ගලික රෝහල්/සාත්තු නිවාස ගාස්තු*), 'සන්නිවේදන' 'විනෝදාත්මක හා සංස්කෘතික' (*පොත්*), ‘අධ්‍යාපන' (*උසස් අධ්‍යාපන පාඨමාලා ගාස්තු*), 'ආපනශාලා සහ හෝටල්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*බුලත්, පුවක්*), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන ' (*ගොඩනැගිලි ද්‍රව්‍ය*) සහ ‘ප්‍රවාහන' (*පෙට්‍රල්*) යන කාණ්ඩවල අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 ඔක්තෝම්බර් මාසයේ 62.4% සිට 2022 නොවැම්බර් මාසයේ 60.1% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |
| | ජූලි | 244.4 | 289.3 | 209.1 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 82.5 | 52.4 | 57.3 |
| | අගෝ. | 250.4 | 294.3 | 215.8 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 84.6 | 57.1 | 60.5 |
| | සැප්. | 256.2 | 296.5 | 224.5 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 85.8 | 62.8 | 64.1 |
| | ඔක්. | 256.9 | 294.1 | 227.7 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 80.9 | 61.3 | 62.4 |
| | නොවැ. | 256.3 | 291.2 | 228.7 | 244.9 | -0.2 | 0.1 | 65.0 | 69.8 | 60.4 | 60.1 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව